www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සසපට එරෙහි ජවිපෙ තර්ජනවලට විරුද්ධ වනු

## Sri Lanka: Oppose the JVP threats against the SEP

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**
**2007 නොවැම්බර් 10**

ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ආධාරකරුවන් විසින් මහ බැංකු සේවක සංගමයේ (මබැසේස) නායකත්වයට එරෙහිව සිදු කරනු ලැබ ඇති තර්ජනය හෙලා දකින ලෙස ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටී.

සැප්තැම්බර් මස පැවති මබැසේස වාර්ෂික මහා සභා රැස්වීමේ දී සම්මත කෙරුනු දේශපාලන යෝජනාවකට ප්‍රතිචාර ලෙස, ජවිපෙට අනුබද්ධිත ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමය (ශ්‍රීලමබැසේස), මබැසේස සභාපති කේ.බී. මාවිකුඹුර සහ එහි භාන්ඩාගාරික එම්.ඩබ්ලිව්. පියරත්න "සිංහල කොටි" එනම් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ සිංහල ආධාරකරුවන් ලෙස හංවඩු ගසමින් අවලාදාත්මක පත්‍රිකාවක් නිකුත් කලේ ය. මාවිකුඹුර සහ පියරත්න යන දෙදෙනාම, එල්ටීටීඊයටත් අනුප්‍රාප්තික කොලඹ ආන්ඩුවලටත් යන දෙපාර්ශ්වයට ම ස්ථිරසාර ලෙස විරුද්ධව සිටින සසපට ආධාර කරති.

ශ්‍රීලමබැසේස පත්‍රිකාව හුදෙක් අවලාදාත්මක ප්‍රකාශයක් පමනක් නොවේ. ශ්‍රී ලංකාවේ සැම අයෙකු ම දන්නා පරිදි, පසුගිය වසර දෙකක කාලය මුලුල්ලේ මිලිටරියේ පිටුබලය ලබන ඝාතක කල්ලි මිනිසුන් සිය ගනනක් ඝාතනයට හෝ "අතුරුදහන් කිරීමට" ලක් කර ඇති කොන්දේසි තුල, එය භයංකර තර්ජනයකි. වර්ගවාදී දේශපාලනයේ භාෂාවට අනුව, "සිංහල කොටි" ලෙස හංවඩු ගසනු ලබන ඕනෑම කෙනෙක් ද්‍රෝහියකු වන අතර ඔවුන් සම්බන්ධයෙන් ක්‍රියා කල යුත්තේ එයට අනුකූලව ය. සසප එවන් තර්ජන සැහැල්ලුවෙන් නොගනී. වඩාත් පැහැදිලිව අපගේ මතකයට නැගෙන්නේ, ජවිපෙ තුවක්කුකරුවන් ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධ ඔවුන්ගේ ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට එරෙහි වූ දේශපාලන විරුද්ධවාදීන් හා වෘත්තීය සාංගමිකයන් සිය ගනනක් මරා දැමූ 1980 දශකයේ අග සමය යි. අපගේ ම සහෝදරවරු තිදෙනෙක් ද ඝාතනය කරන ලදි.

1980 ගනන්වල දී, ජවිපෙ තමන් සමාජවාදී යැයි කියාගත් අතර දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂ (එජාප) ආන්ඩුවට නාමිකව විරුද්ධ විය. අද ජවිපෙ ජනාධිපති මහින්ද රාජපක්ෂ ආන්ඩුවට විවෘතව සහයෝගය දෙන අතර එල්ටීටීඊයට එරෙහිව ආන්ඩුව යලි අරඹා ඇති වර්ගවාදී යුද්ධයේ වඩාත් ම ඝෝෂාකාරී උද්ඝෝෂකයෙක් ද වේ. ආන්ඩුව හා එහි ජවිපෙ මුක්කුකරුවන් විසින් ඉලක්ක කර ගනු ලැබ ඇත්තේ හුදෙක් සසප පමනක් නොවේ. සිය මූලික අයිතීන් හා ජීවන මට්ටම් රැක ගනු වස් යුද්ධයට විරුද්ධ වන ඕනෑම අයෙක් ඔවුන්ගේ ඉලක්කයකි.

2006 ජුලි මස රාජපක්ෂ නැගෙනහිර පලාතේ ප්‍රථම මිලිටරි ආක්‍රමනය දියත් කිරීමට සූදානම් වන විට, ජවිපෙට අනුබද්ධිත දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ නායකයකු වන ඇල්ලේ ගුනවංශ රාජ්‍ය රූපවාහිනියේ පෙනී සිට, වර්ජක වරාය කම්කරුවන් "කඩාකප්පල්කාරී" ක්‍රියාවක යෙදෙන "ජාති ද්‍රෝහී බලවේග" ලෙස හෙලා දුටුවේ ය. එතැන් පටන් ආන්ඩුවේ ඇමතිවරු හා යුද්ධයේ ස්වෝත්තමවාදී ආධාරකරුවෝ, වර්ජක වතු කම්කරුවන්ට, විශ්වවිද්‍යාල සේවකයන්ට, ගුරුවරුන්ට, සෞඛ්‍ය කම්කරුවන්ට හා සෙසු කම්කරුවන්ට එරෙහිව එවන් චෝදනා එල්ල කර තිබේ.

ජවිපෙට අනුබද්ධිත අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) ද විශ්වවිද්‍යාල තුල සාකච්ඡා හා විවාද මඩිනු පිනිස ඊට සමාන බියගැන්වීමේ විධික්‍රම යොදා ගනී. අගෝස්තු මාසයේ දී මහනුවර අසල පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දී, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයට ද ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද නායකත්වයෙන් යුත් මිලිටරි වාඩිලෑම්වලට ද එරෙහිව උද්ඝෝෂනයක යෙදී සිටි සසජාශි සාමාජිකයන්ට ශාරීරිකව පහර දෙන බවට අවිශිබම සාමාජිකයෝ තර්ජනය කලහ. ජවිපෙ සිය අතීත අධිරාජ්‍ය-විරෝධී හිස් පුච්චානම් අතහැර දමා දැන් ශ්‍රී ලංකාවේ වර්ගවාදී යුද්ධයේ ප්‍රයෝජනවත් සගයකු ලෙස එක්සත් ජනපදය වැලඳගෙන තිබේ.

මෙම යුද්ධය ඔබගේ යුද්ධයක් නොවේ යැයි සසප හා සසජාහි කම්කරුවන්ට හා ශිෂ්‍යයන්ට කෙලින් ම කියා සිටී. නිදහසේ පටන් මේ දක්වා ම, පාලක ප්‍රභූහු කම්කරුවන් එකිනෙකාගෙන් භේද කරනු පිනිස වාර්ගික වෛරයන් අවුලුවා තිබේ. 1983 දී, එජාපය, සිය වෙලඳ පොල-හිතැති පිලිවෙත්වලට එරෙහිව

මහජන ව්‍යාපාරයකට මුහුන දුන් තතු තුල, රට යුද්ධය තුලට ඇද දැමීමට ක්‍රියා කලේ ය. ප්‍රධාන පක්ෂ සියල්ලක් ම මෙම යුද්ධය අවසන් කිරිමෙහි ලා සිය නොහැකියාව ඔප්පු කර ඇත්තේ, ඔවුන් සිංහල අධිපතිවාදී දේශපාලනයේ කර වටක් ගිලී ඇති නිසා ම ය. යුද්ධයට විරුද්ධ වීමෙන් එල්ටීටීඊයට සහාය දීමක් අදහස් නොවේ. එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය නියෝජනය කරන්නේ දෙමල කම්කරුවන්ගේ හා ගොවීන්ගේ අවශ්‍යතා නොව දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා ය.

මබැසේස නායකයන්ට එරෙහිව ජවිපෙ තර්ජන එල්ල කරන්නේ, සසප යුද්ධයට හා ජීවන මිටටම් මත එල්ල කෙරෙන නිමක් නැති ප්‍රහාරයන්ට විරුද්ධව සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් ඒකාබද්ධ කිරීමට උද්ඝෝෂනය කරන නිසා ම ය. යුද්ධය අවසන් කිරීමේ ක්‍රියාමාර්ගයකින් තොරව රැකියා. වැටුප් හා සේවා කොන්දේසි ආරක්ෂා කර ගත නොහැකි යැයි මබැසේස වාර්ෂික මහා සභා රැස්වීමේ දී සම්මත කෙරුනු යෝජනාව ප්‍රකාශ කර සිටියේ ය. පසුගිය වසර දෙකක කාලය තුල එක් අරගලයකින් පසුව තවත් අරගලයක දී, යුද ප්‍රයත්නය වෙනුවෙන් කැප කිරීම් කල යුතු යැයි ආන්ඩුව කල ඉල්ලීම්වලට අභියෝග කිරීම ප්‍රතික්ෂේප කල ඔවුන්ගේ සමිති නායකයන් විසින් කම්කරුවන් පාවා දෙනු ලැබ ඇත.

ජවිපෙට අනුබද්ධිත සමිති වඩාත්ම දෙබිඩි පිලිවෙතක් අනුගමනය කරන බව ඔප්පු වී තිබේ. ඔවුන්ගේ සියලු සටන්කාමී වාග් හරඹවලට ප්‍රතිකූලව, ජවිපෙ යුද්ධයට මුලුමනින් ම පිටුබලය දෙන අතර ඔවුන්ගේ සමිති ආන්ඩුවට යලි යලිත් යටත් වී ඇත. හේතුව පැහැදිලි ය. ආන්ඩුව මිලිටරිය වෙනුවෙන් රුපියල් බිලියන ගනන් වැය කරන අතර මෑත ම අයවැයේ දී ආරක්ෂක වියදම් යලිත් ඉහල දමා තිබේ. වැටුප් වැඩි කිරීමට, ශිෂ්ට සම්පන්න අධ්‍යාපනයක් හෝ ගම්බද සහනාධාර ලබා දීමට මුදල් නැතැයි ආන්ඩුවේ ඇමතිවරු වර්ජක කම්කරුවන්ට, විරෝධතාවල යෙදෙන ශිෂ්‍යයන්ට හා අසහනයට පත්ව සිටින ගොවීන්ට පුන පුනා පැවසීම පුදුමයට කාරනාවක් නොවේ. ජවිපෙ එයට එකඟ ය.

ශ්‍රීලමබැසේස පත්‍රිකාව, හමුදාව මහජනයා ආරක්ෂා කරන්නේ යැයි කියාපාමින්, උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව හමුදා ඉවත් කරන ලෙස සසප කරන ඉල්ලීමට පහර දෙයි. සන්නද්ධ හමුදාවෝ, මහජනයා ආරක්ෂා කරනවා නොව, තථ්‍ය වසයෙන් ම යුද නීතිය රජයන පාලනයක් පවත්වා ගෙන යමින් විශේෂයෙන් ම දෙමල ජනයාගෙන් එල්ල වන ඕනෑම විරුද්ධත්වයක් මඩිනු පිනිස වඩාත් ම ම්ලේච්ඡ විධික්‍රම යොදා ගනිති. හමුදා ඉවත් කිරීමට කරන ඉල්ලීමෙන් අර්ථවත් කෙරෙන්නේ, එල්ටීටීඊයට සහාය දීමක් නොව, උතුරේ හා නැගෙනහිර වැඩ කරන ජනතාව සමග සහයෝගිතාත් ඔවුන්ගේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමත් ය. එය වනාහි කම්කරු පන්තියේ එකමුතුව ගොඩනැගීමේ ද ආන්ඩුවට හා එල්ටීටීඊයට එරෙහි ඒකාබද්ධ අරගලයක් තුල දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් බලමුලු ගැන්වීමේ ද අති මූලික ප්‍රථම පියවර යි.

ශ්‍රීලමබැසේස පත්‍රිකාවේ ඉතිරි කොටස බොරුවලින්, "දේශද්‍රෝහී ක්‍රියා" පිලිබඳ හෙලාදැකීම්වලින් හා "රටට ආදරය" කරන ලෙස කෙරෙන ආයාචනාවලින් සමන්විත වෙයි. මබැසේස සභාපති කේ.බී. මාවිකුඹුර "එල්ටීටීඊ ත්‍රස්තවාදයට උඩ ගෙඩි දෙන ව්‍යාපෘතියක් කලක සිට දියත් කර ගෙන" යන බවක් ප්‍රකාශ කරන එම පත්‍රිකාව ජීවිත 86ක් බිලි ගත් 1996 මහ බැංකුවේ බෝම්බ ප්‍රහාරය වැන්නක් යලි සැලසුම් කිරීමට ඔහු එල්ටීටීඊයට උදව් කරමින් සිටින බවක් ද අඟවයි. සසපයේ ද එහි පූර්වගාමියා වන විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ද දිගු කාලීන වාර්තාව මගින් පෙන්නුම් කෙරෙන්නේ, අප එල්ටීටීඊයේ හා සන්නද්ධ හමුදාවල යන දෙපාර්ශ්වයේ ම ත්‍රස්තවාදයට විරුද්ධ වී ඇති බව යි. 1996 දී විකොස මහ බැංකුවේ බෝම්බ ප්‍රහාරය ප්‍රසිද්ධියේ හෙලා දකිමින් පෙන්වා දුන්නේ, එය වැඩ කරන ජනතාව අතර වඩා දරුනු වාර්ගික භේදයන් වැපිරීමට තුඩු දෙනු ඇති බව යි.

ජවිපෙ, ආන්ඩුවට හා එහි වර්ගවාදී යුද්ධයට සහාය නොදෙන ඕනෑම අයෙකු "කොටියකු" හා ද්‍රෝහියකු ලෙස හෙලා දකී. එලෙස ම, තමන් "දෙමල ජාතියේ එකම නියෝජිතයා" ලෙස පිලිනොගන්නා ඕනෑම අයෙකු ආන්ඩුවේ උදව්කරුවෙක් යැයි එල්ටීටීඊය ද ප්‍රකාශ කරයි. මෙම වර්ගවාදී යුද්ධයේ දෙපාර්ශ්වය ම සිය දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ක්ෂමා විරහිත ලෙස ක්‍රියා කිරීමට කිසිදු පැකිලීමක් දක්වා නැත.

සසප මෙම සාවද්‍ය විකල්ප නිශ්චිතව ම ප්‍රතික්ෂේප කරයි: කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය පාලක පන්තියේ ප්‍රතිවාදී කොටස් නියෝජනය කරන අතර දෙගොල්ල ම ලාභ ගරන ක්‍රමය ආරක්ෂා කරති. වැඩ කරන ජනතාව ඉදිරියේ පවතින යථා විකල්පය වන්නේ, දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා සටන් වැදීම පිනිස ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම යි.

සසපට එරෙහි මෙම ප්‍රහාරයේ රුදුරු භාවය සියලු ම කම්කරුවන්ට තියුනු අනතුරු ඇඟවීමකි. ගැඹුරින් ම ජනතා අප්‍රසාදයට ලක්ව ඇති යුද්ධයේ බර වැඩ කරන ජනතාව වෙතින් විරුද්ධත්වයක් අවුලුවාලන විට, ආන්ඩුව හා එහි ස්වෝත්තමවාදී ආධාරකරුවෝ, තමන්ට අභියෝග කරන ඕනෑම අයෙකුට එරෙහි සිය

දඬයම උත්සන්න කිරීම නොවැලැක්විය හැකි ය. යුද්ධය සඳහා දේශහිතෛෂී කැප කිරීම් ඉල්ලා කෙරෙන උමතු හඬතැලීම් මධ්‍යයේ, රාජපක්ෂ ආන්ඩුව වර්ජන තහනම් කිරීමේ, වාරන පැනවීමේ හා පුද්ගලයන් නඩු නැතිව රඳවා ගැනීමේ පොලිස් රාජ්‍ය විධිවිධාන දැනටමත් බලාත්මක කර ඇත. මිලිටරියේ පිටුබලය ලබන ඝාතක කල්ලි ක්‍රියාත්මක වෙමින් තිබේ. වෘත්තීය සමිති තුල හා ශිෂ්‍යයන් අතර, විරුද්ධවාදීන්ට ඇඟිල්ල දිගු කිරීම හා ඔවුන්ට තර්ජනය කිරීම මගින් ජවිපෙ ආන්ඩුව වෙනුවෙන් තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කරයි.

1980 ගනන් අග දී, මබැසේස, විකොස නායකත්වය යටතේ, රාජ්‍ය මර්දනයට හා ජවිපෙ මැර කල්ලිවල ෆැසිස්ට් ප්‍රහාරවලට එරෙහිව කම්කරුවන් ආරක්ෂා කරනු පිනිස කම්කරු පන්ති සංවිධානවල එක්සත් පෙරමුනක් සඳහා ශ්‍රී ලංකාව තුල හා ජාත්‍යන්තරව බලගතු උද්ඝෝෂනයක් ගෙන ගියේ ය. අද කම්කරු පන්තිය ඊට සමාන අන්තරායන්ට මුහුන දෙන අතර ඔවුන් එම තර්ජනයට ස්වකීය පන්ති ප්‍රතිචාරය වර්ධනය කර ගත යුතු ය. අන් සියල්ලට මත් වඩා එයින් අදහස් කෙරෙන්නේ පාලක පන්තියේ සියලු පක්ෂවලට එරෙහිව ස්වාධීන සමාජවාදී විකල්පය ලෙස සසප ගොඩනැගීම යි.

මබැසේස නායකත්වයේ අපගේ සහෝදරවරුන්ට එරෙහි තර්ජනය හෙලා දකින යෝජනා සම්මත කිරීමට සිය වැඩ පොලවල, පාසල් හා විශ්වවිද්‍යාල තුල උද්ඝෝෂනය කරන ලෙස සියලු කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් සසප හා සසජාශි ඉල්ලා සිටී. මෙම පියවර, ශ්‍රී ලංකාවේ නිල දේශපාලනය ද ජීවිතයේ සෑම අංශයක් ද මත ම ආධිපත්‍යය දරන ස්වෝත්තමවාදයේ හා මිලිටරිවාදයේ විෂඝෝර වාතාවරනයට එරෙහිව කම්කරු පන්තියේ හා තරුන ජනයාගේ වඩා පුලුල් ප්‍රතිප්‍රහාරයක කොටසක් විය යුතු ය. ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ වෙබ් අඩවිය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙසත් අපගේ ක්‍රියාමාර්ගය අධ්‍යයනය කොට සසපට හා සසජාශි සංවිධානයට බැඳීමට ඉල්ලුම් කරන ලෙසත් කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org